# 45

ජේසුනි මගෙ දිව්‍ය එළියක් කළ මැනව
අඹරේ දිලිසෙන – රිදියෙන් නිමැවුන
නොනිවෙන තරුවක් සේ

ඔබගේ වරම් ලැබ වැඩෙම් මෙමා
සරණ වෙන්නෙ මගෙ සොයුරු සැමා

ජේසුනි මගෙ දිව්‍ය පඩුරක් කළ මැනව
උදයේ පොපියන – බඹරුන් රොක්වන
සුවඳැති පියුමක් සේ

ජේසුනි මගෙ දිව්‍ය වරමක් කළ මැනව
සැමහට හිම්වන – සගයට ගෙන යන
ඔබේ පෙම් තිළිනක් සේ

ජේසුනි මගෙ දිව්‍ය පියුමක් කළ මැනව
පව් දොස දුරලන – ජීවය ගෙන දෙන
කුරුසියෙ යාගය සේ